# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2389/05 – 2024 ජුනි මස 17 වැනි සඳුදා – 2024.06.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2020/270.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.12.22 දිනැති හා අංක 2363/71 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.12.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. පානදුර, සිරිල් ජැන්ස් මාවත, අංක 217/25 හි පදිංචි එම්. ජේ. චන්ද්‍රසේන මයා 2. පන්නිපිටිය, දෙපානම, සමගි මාවත, අංක 35/5 හි පදිංචි බී. චන්ද්‍රසේකර මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A88/2023 හා 2024.05.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය: IR/COM/02/2020/270.

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

1. එම්. ජේ. චන්ද්‍රසේන මයා
   අංක 217/25,
   සිරිල් ජැන්ස් මාවත,
   පානදුර.

2. බී. චන්ද්‍රසේකර මයා
   අංක 35/5,
   සමගි මාවත,
   දෙපානම,
   පන්නිපිටිය.

*පළමුවන පාර්ශ්වකරු*

එදිරිව

නඩු අංකය: A/88/2023.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

**බේරුම්කරණ ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත දෙපාර්ශ්වය අතර පැන නැගී ඇති ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩමාදුව, ද විලේජ් හි අංක 202/බී/61 පදිංචි නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම වන මා 2023.12.15 වන දින පත් කරනු ලැබීය.

ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල් බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාගේ අංක IR/COM/02/2020/270 හා 2023 දෙසැම්බර් 05 දිනැති ලේඛනය මගින් ඉහත දෙපාර්ශ්වය අතර කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණ වශයෙන් “ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයන් වන ජේ. එම්. චන්ද්‍රසේන මහතාට සහ බී. චන්ද්‍රසේකර මහතාට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කිරීමේදී පහත කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.”

- තනතුරු නාමය වෙනස්වීම
- වැටුප් විෂමතාවයක් සිදුව තිබේනම් එසේ විෂමතාවයක් ඇතිවීම
- උසස්වීම් ලබා දීමේදී ආයතනය කටයුතු කර ඇති ආකාරය

මේ අනුව දෙපාර්ශ්වය 2024.01.19 දින කම්කරු දෙපාර්තමේන්තුවේ බේරුම්කරණ අංශයට කැඳවනු ලැබීය. දෙපාර්ශ්වයම එදින බේරුම්කරු ඉදිරියේදී පෙනී සිටි අතර ප්‍රථමයෙන්ම කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් මා වෙත ලබා දී ඇති බේරුම්කරණයට අදාළ ආරාවුලේ යොමුව පැහැදිලි කර දුන් අතර එම යොමුව නිවැරදි බවට දෙපාර්ශ්වයම පිළිගන්නා ලදී. අනතුරුව මෙම ආරාවුල නිරවුල් කිරීමේ පරිපාටිය වශයෙන් ඉදිරිපත් වී ඇති යොමුව සංශෝධනය වන්නේ ද යන්න විමසූ අතර එවැනි සංශෝධනයක්

නොමැති බව පාර්ශ්වකරුවන් ප්‍රකාශ කළ හෙයින් සමථයක් මගින් මෙම ආරාවුල් නිරවුල් කිරීමට උත්සාහ කරන බවත් සුවිශේෂී හේතුවක් මත පමණක් සාක්ෂි විමසීමක් සිදු කරන බවත් එසේ නොමැත්තේ නම් ලිඛිත ප්‍රකාශ හෝ දිවුරුම් ප්‍රකාශ මගින් පාර්ශ්වයන්ගේ ලේඛන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන බවත් දෙපාර්ශ්වයටම දන්වා සිටින ලදී. එමෙන්ම මෙම බේරුම්කරණය අවසානයේදී කිසියම් පාර්ශ්වයක් මූල්‍යමය සහනයක් අපේක්ෂා කරන්නේ නම් එම අපේක්ෂිත මූල්‍යමය සහනයට අදාළ ලේඛන පැහැදිලිව ඉදිරිපත් කළ යුතු බව පෙන්වා දුනිමි. එමෙන්ම මෙම කරුණ සම්බන්ධව කිසියම් අධිකරණයක නඩු කටයුත්තක් පවතින්නේ නම් එය වාර්තා වූ වහාම විභාගය අත්හිටුවන බව පාර්ශ්වයන්ට පැහැදිලි කර දුනිමි.

පරීක්ෂණය ආරම්භ කරන අවස්ථාවේදී පළමුවන පාර්ශ්වයේ පළමුවන ඉල්ලුම්කරු වන ජේ. එම්. චන්ද්‍රසේන මයා මෙම විභාගය සඳහා සහභාගි නොවන බවත් ඔහුගේ නම ඉවත් කරන ලෙසට තමා වෙත දන්වා සිටි බවත් පළමුවන පාර්ශ්වයේ දෙවන ඉල්ලුම්කාර බී. චන්ද්‍රසේකර මහතා ප්‍රකාශ කරන ලදී. කෙසේ වෙතත් මෙම පරීක්ෂණය අවසන් වන තෙක් එම්. ජේ. චන්ද්‍රසේන මයා ඉදිරිපත් නොවූ හෙයින් ඔහු නොමැතිව බී. චන්ද්‍රසේකර මහතාගේ සහභාගීත්වයෙන් පරීක්ෂණය පැවැත්වීමට තීරණය කලෙමි.

පළමුවන පාර්ශ්වයේ බී. චන්ද්‍රසේකර මහතා ප්‍රකාශ කරනු ලැබුවේ තමා සක්‍රීය සේවයේ නියුතු අයෙකු නොවන බවත් මේ වන විට විශ්‍රාම ලබා ඇති බවත් තමා සක්‍රීය සේවයේ යෙදී සිටියදී තමාට සිදුවූ අසාධාරණය සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම අපේක්ෂාවෙන් ඉල්ලීමක් කළ බවත් ඒ අනුව අද දින පරීක්ෂණයට පැමිණි බවයි. බී. චන්ද්‍රසේකර මහතා කියා සිටින්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරයෙකු වශයෙන් සේවය කළ තමාගේ නිල නාමය ඉංජිනේරු සහකාර වශයෙන් වෙනස් කරන ලද බවත් ඒ සමගම වැටුප් විෂමතාවයක් හා උසස්වීම් ලබාදීමේදී පුද්ගල බද්ධව කටයුතු කිරීම හේතුවෙන් තමාට අසාධාරණයක් සිදුවී ඇති බවයි. තමා 1979.11.14 වන දින ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවයට එක් වූ අතර 1984 ජනවාරි 01 වන දින සිට සේවය ස්ථිර කරනු ලැබූ බවත් 2019.06.07 වන දින තමා සේවයෙන් විශ්‍රාම ගත් බවත් ප්‍රකාශ කරන ලදී. මූලික කරුණු පැහැදිලි කරන අවස්ථාවේදී පළමුවන පාර්ශ්වකරු පුද්ගලිකව පෙනී සිටි අතර දෙවන පාර්ශ්වකරු වෙනුවෙන් ආයතනයේ නීති නිලධාරි හා නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරු පෙනී සිටි බැවින් නීතිඥවරයෙකු නොමැතිව පෙනී සිටීම මගින් අසාධාරණයක් තමාට සිදුවිය හැකි බැවින් ඉදිරි දින සිට නීතිඥ සහාය තමා ලබා ගන්නා බව ප්‍රකාශ කරන ලදී. මේ අනුව 2024.02.28, 2024.03.28 යන දිනවල මෙම විභාගය පැවැත්වූ අතර 2024.02.28 ආරම්භයේදීම දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් ප්‍රකාශ කරනු ලැබුවේ මෙම බේරුම්කරණ නඩුව සම්බන්ධව මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරන බැවින් ඒ සඳහා ඉඩ ලබාදෙන ලෙසය. ඒ අනුව 2024.02.28 වන දින විභාගය කැඳවූ අවස්ථාවේදී මූලික විරෝධතා ඉදිරිපත් කිරීමටත් එම විරෝධතාවයන්ට අනුව ප්‍රතිවිරෝධතා ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දෙන ලදී. පළමුවන පාර්ශ්වයේ ඉල්ලීම සම්බන්ධව දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටියේ නිල නාමය ඉංජිනේරු තනතුරේ සිට ඉංජිනේරු සහකාර දක්වා වෙනස් කිරීම දෙවන පාර්ශ්වකාර ආයතනයේ නොව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද්දක් බවත් පළමුවන පාර්ශ්වකරුට පමණක් නොව සියලුම මාණ්ඩලික තනතුරු සඳහා මෙම තනතුරු නාමයන් වෙනස්වීම බලපා ඇති බවත්ය. කෙසේ වෙතත් මෙම නඩුව ගොනු කරන අවස්ථාව වන විට ඉල්ලුම්කාර බී. චන්ද්‍රසේකර මහතා විශ්‍රාම ගිය අයෙකු බවත් ඒ අනුව කාර්මික ආරාවුල් පනතේ දැක්වෙන පරිදි සජීවී ආරාවුලක් නොමැති බවත් එම හේතුව මතම බේරුම්කරුවෙකුට මෙම නඩුව අසා තීරණයක් දීමට නෛතික බලයක් නොමැති බවත් දෙවන පාර්ශ්වයේ නීතිඥවරුන් පෙන්වා දෙන ලදී. ඒ අනුව ඊට අදාළ ලේඛන ගොනු කරන ලෙසට ඉල්ලා සිටි අතර එම ලේඛන 2024.03.06 වන දින ගොනු කරන ලදී. එම මූලික විරෝධතාවයෙහි පළමුවන පාර්ශ්වයේ දෙවන ඉල්ලුම්කාර බී. චන්ද්‍රසේකර මහතා 2019.06.07 වන දින විශ්‍රාම ගොස් ඇති බව කම්කරු දෙපාර්තමේන්තුව වෙත මුල් පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ ඔහු විශ්‍රාම ගැන්වීමෙන් පසුව බවත් ඒ අනුව 1950 අංක 43 දරන (සංශෝධිත) කාර්මික ආරාවුල් පනතේ 19 හා 17(2) වගන්තිය අනුව පළමුවන පාර්ශ්වයට බේරුම්කරණ අධිකරණයෙන් සහන ලබා ගැනීමට නෛතික බලයක් නොමැති බවත් අදාළ නඩු තීන්දු සමග ඉදිරිපත් කරන ලදී.

තවදුරටත් ඔවුන් ප්‍රකාශ කරනුයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තනතුරු ප්‍රතිව්‍යුහගත කිරීම 2006.09.22 දිනැති කළමනාකරණ, සේවා චක්‍රලේඛ අංක 30 ට අනුව සිදු වූ බවත් ඉතා දීර්ඝ කාලයකට පෙර සිදු වූ සිද්ධි මාලාවක් පදනම් කරගෙන මෙම නඩුව පවරා ඇති බවත්ය. එම මූලික විරෝධතාවය සම්බන්ධව පළමුවන පාර්ශ්වයේ බී. චන්ද්‍රසේකර මහතා ලිඛිතව 2024.04.08 වන දින පළමුවන පාර්ශ්වකරු විසින් ගොනු කරන ලද මූලික විරෝධතා ප්‍රකාශයේ අංක 02(අ) යටතේ ප්‍රකාශ කර සිටින්නේ මෙම පළමුවන පාර්ශ්වයේ ඉල්ලීම ඉදිරිපත්කොට ඇත්තේ විශ්‍රාම ගැනීමෙන් පසුව බව තමන් පිළිගන්නා බවයි. එහෙත් අදාළ නඩු තීන්දු ගොනු කරමින් කියා සිටින්නේ සජීවී ආරාවුල යන්න සම්බන්ධව දී ඇති අධිකරණ තීන්දු අනුව මෙම නඩුව විභාග කළ හැකි බවයි.

මේ සම්බන්ධව මා විසින් පෞද්ගලිකව කාර්මික ආරාවුල් අංශයේ මෙම නඩුවට අදාළ ලිපිගොනුව පරීක්ෂා කළ අතර එහිදීද අනාවරණය වූයේ මෙම ඉල්ලීම ඉදිරිපත්කොට ඇත්තේ බී. චන්ද්‍රසේකර මහතා විශ්‍රාම ගැනීමෙන් පසුව බවට එහි පැහැදිලිව සටහනක් තබා ඇති බවයි. ඒ අනුව දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති මූලික විරෝධතාවය අනුව සජීවී ආරාවුලක් නොමැති බවට වූ ප්‍රකාශය පිළිගනිමි. ඒ අනුව මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි බැවින් පළමුවන පාර්ශ්වයේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්තිසහගත බව තීරණය කළෙමි.

**නීතිඥ ඩබ්ලිව්. ඒ. ජයවික්‍රම,**
බේරුම්කරු.

2024 මැයි මස 08 වැනි දින දී ය.

EOG 06 – 0132

---

මගේ අංකය: IR/COM/01/2016/151.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.11.19 දිනැති හා අංක 2306/86 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.31 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. කඩවත, මාවරමණ්ඩිය, කටුකුරුන්ද වත්ත, අංක 62/25 හි පදිංචි කාන්ති කළුආරච්චි මෙනවිය 2. පන්නිපිටිය, දෙපානම, අරලිය උයන, අංක 22/14 හි පදිංචි සුනිල් රත්නසිරි මයා 3. රත්මලාන, ශ්‍රී ධර්මාරාම පාර, අංක 76/1බී හි පදිංචි ටයිටස් පෙරේරා මයා 4. ගල්කිස්ස, කටුකුරුඳුවත්ත, අංක 493 හි පදිංචි ඊ. ඩී. කුමුදිනී මිය 5. දෙල්ගොඩ, මීගහවත්ත පාර, අංක 93/6 හි පදිංචි ඩී. එම්. ජයවීර මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A74/2022 හා 2024.05.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී

A/74/2022
IR/COM/01/2016/151

1. කාන්ති කළුආරච්චි මෙනවිය
   අංක 62/25, කටුකුරුන්ද වත්ත,
   මාවරමණ්ඩිය,
   කඩවත.

2. සුනිල් රත්නසිරි මයා
   අංක 22/14,
   අරලිය උයන,
   දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා
   අංක 76/1බී, ශ්‍රී ධර්මාරාම පාර,
   රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය
   අංක 493, කටුකුරුඳුවත්ත,
   ගල්කිස්ස.
5. ඩී. එම්. ජයවීර මයා
   අංක 93/6, මීගහවත්ත පාර,
   දෙල්ගොඩ.

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමන් වෙත පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2022.10.31 දින දරන නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත් කර, මා වෙත යොමු කොට ඇත.

**මෙම ආරාවුලට හේතුවී ඇති කරුණු වනුයේ,**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයේ නියුතු කාන්ති කළුආරච්චි මෙනවිය, සුනිල් රත්නසිරි මයා, ටයිටස් පෙරේරා මයා, ඊ. ඩී. කුමුදුනී මිය, ඩී. එම්. ජයවීර මයා යන නම් සඳහන් සේවක පිරිස විධායක II ශ්‍රේණියේ කළමනාකරු (මුදල්) තනතුරෙහි සිට විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) තනතුර දක්වා උසස්වීමේ අවස්ථාව අහිමි කිරීම මගින් එකී සේවකයන්ට යම් අසාධාරණයක් සිදු වූයේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද? යන්න පිළිබඳව වේ.

ඒ අනුව මෙකී විභාගය,
2022.12.01
2022.12.15
2023.01.05
2023.01.26
2023.02.16
2023.03.30
2023.04.06 දින කැඳවා පවත්වාගෙන ගිය අතර මෙම ආරාවුලේ පැමිණිලි පාර්ශ්වය වශයෙන්,

01. කාන්ති කළුආරච්චි මෙනවිය,
02. සුනිල් රත්නසිරි මයා,
03. ටයිටස් පෙරේරා මයා,
04. ඊ. ඩී. කුමුදුනී මිය,
05. ඩී. එම්. ජයවීර මයා,

මෙම ඉල්ලුම්කරුවන් පළමු පාර්ශ්වය ලෙසත් මෙම ඉල්ලුම්කරුවන්ගේ සේවා ආයතනය වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය දෙවන පාර්ශ්වය ලෙසත් ඉදිරිපත් වී ඇති අතර පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත නීතිඥ මෛත්‍රී පිටවල මහතාත් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ අපර්ණා තිලකරත්න මහත්මියත් පෙනී සිටී.

මෙම ඉල්ලුම්කරුවන් ඉල්ලා සිටිනු ලබන්නේ තමන්ට අගතියක් වී ඇති විධායක II ශ්‍රේණියේ කළමනාකරු (මුදල්) තනතුරෙහි සිට විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) තනතුර දක්වා උසස්වීමේ අවස්ථාව අහිමි කිරීම අසාධාරණ සහ අයුක්ති සහගත බවට නියෝග කර ඊට සහනයක් ලෙස තමා එම තනතුරට අයැදුම් කළ 2009.06.22 දින සිට බලපැවැත්වෙන පරිදි එම තනතුරේ පිහිටුවීමට දෙවන පාර්ශ්වයට නියෝග කර එසේ නියෝග කරන දින තෙක් 2009.06.22 දින සිට තමාට අහිමි වූ වැටුප් සහ සියලු දීමනා ලබාදීමට නියෝග කරන ලෙසත් වේ.

මෙම ආරාවුල වෙනුවෙන් අපේක්ෂිත සහනයන් ලබාදීම පිණිස වසර 2017 සිට 2023 දක්වා වූ කාලය තුළ ආරාවුල් විභාග පවත්වා ඇත. ඒ අනුව අංක IR/COM/01/2016/151 හා 2017.09.24 දිනැති ලිපිය අනුව, A/35/2017 යන නඩු අංකය යටතේ මෙම කාර්මික ආරාවුල බේරුම්කරු ලෙස පී. දනන්සූරිය මහතා පත්කොට ඇත. ඒ අනුව, පහත සඳහන් දිනයන්හි නඩුව විභාග කරන ලදි.

| *දිනය* | *වාර ගණන* |
|---|---|
| 2017.12.08 | 01 |
| 2018.01.29 හා 2018.12.03 | 11 |
| 2019.01.08 හා 2019.06.18 | 08 |
| පැවැත්වූ වාර ගණන | 20 |

ඒ අතර වාරයේ 2017.12.08 වන දින සිට විභාග වාර 20 ක්ද, 2019.08.19 දින A/88/2019 නඩු අංකය යටතේ බේරුම්කාර ලෙස එස්. ජී. සූරියආරච්චි මහතා පත්කර ඇති අතර, විමසීම් කර නොමැත. මෙම ආරාවුල යළි සමථයට පත්කිරීමට 2020.03.13 දින නඩු අංක A/27/2020 යටතේ ඩී. එම්. කරුණාරත්න මහතා පත් කළ අතර, ඒ මහතා ද නඩු වාර පවත්වා නොමැත.

ඉන් අනතුරුව, 2021.11.10 දින නඩු අංක A/64/2021 දරන බේරුම්කරණ විභාගය රවින්ද්‍ර ලාල් ගුණවර්ධන මහතා වෙත පවරා ඇත. ඒ මහතා යටතේ පහත සඳහන් දිනවල නඩුව විභාග කර ඇත.

| *දිනය* | *වාර ගණන* |
|---|---|
| 2022.03.11 | 01 |
| 2022.08.12 | 01 |
| පැවැත්වූ වාර ගණන | 02 |

එසේම, 2022.10.31 දින නඩු අංක A/74/2022 යටතේ නැවත මෙම පරීක්ෂණය බේරුම්කාර සරත් චන්ද්‍රසිරි විතාන වන මා වෙත පවරා තිබිණි. ඒ අනුව 2022.12.01 දින සිට 2023.04.06 දින දක්වා මෙම විභාගය කැඳවා ඇති අතර, ඉතා දීර්ඝ කාලයක් මෙම ආරාවුල විසඳීමට ගත කර ඇති බව නිරීක්ෂණය වේ. විභාගය පවත්වා ඇති වාර ගණන පහත දැක්වේ.

| *දිනය* | *වාර ගණන* |
|---|---|
| 2022.12.01 හා 2022.12.15 | 02 |
| 2023.01.05 හා 2023.04.06 | 05 |
| පැවැත්වූ වාර ගණන | 07 |

මේ අනුව, මෙම ආරාවුල විසඳීමට බේරුම්කරුවන් 4 දෙනෙක් විමසීම් වාර 30 ක් පවත්වා ඇති බැවින්, මෙම ආරාවුල විසඳීම වඩාත් සුපරීක්ෂාවෙන් දෙපාර්ශ්වයටම අගතියක් නොවන අයුරින් පසඳාලීම සුදුසු බවට ද නිරීක්ෂණය කරමි.

මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කරුවන් පස්දෙනා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයට බැඳුණු දින, බැඳුණු තනතුර හා සිය අපේක්ෂිත උසස්වීම් සඳහා එවකට දැරූ තනතුරට පත් වූ දින පහත වගුවේ සඳහන් වේ.

| *අනු අංකය* | *නම* | *සේවයට බැඳුණු දිනය* | *බැඳුණු තනතුර* | *වත්මන් තනතුරට පත් වූ දිනය* |
|---|---|---|---|---|
| 1 | කාන්ති කළුආරච්චි | 1987.04.04 | පිරිවැය ලිපිකරු | 2003.05.17 |
| 2 | ඩී. ජී. සුනිල් රත්නසිරි | 1987.01.26 | කා. කම්කරු/පණිවිඩකරු/ආහාර සේවක | 2003.05.17 |
| 3 | එම්. ටයිටස් පෙරේරා | 1985.07.15 | ගණකාධිකාරී අභ්‍යාසලාභී | 2001.04.02 |
| 4 | ඊ. ඩී. කුමුදුනී | 1986.09.01 | ලිපිකරු III ශ්‍රේණිය | 2003.05.17 |
| 5 | ඩී. එම්. ජයවීර | 1985.09.02 | ආරක්ෂක නියාමක | 2003.05.17 |

මේ සඳහා දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන හා දිවුරුම් පෙත්සම් ඇසුරින් ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් මෙන්ම දෙවන පාර්ශ්වයේ එම ඉල්ලීම් ඉටු නොකිරීමට ඉදිරිපත් කළ හේතු සාධක ද විමර්ශනය කළෙමි.

එසේම සාක්ෂි කැඳවීමේදීත් හරස් ප්‍රශ්න හා පැහැදිලි කිරීම් ප්‍රකාශ ද සැළකිල්ලට ගතිමි. අදාල පාර්ශ්වය ගොනු කළ වාර්තා හා ලිඛිත සාක්ෂි මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි අධිකාරි බලය ද, ඉල්ලුම්කරුවන්ගේ අපේක්ෂිත සහන ඉල්ලීමේ සාධාරණත්වය ද මෙහි නිගමනයන්ට සාධාරණ හේතු සාධක කර ගතිමි.

දෙපාර්ශ්වයේම සිය අවස්ථාවන් උපරිම ලෙස විනිශ්චය සඳහා අවස්ථානුකූලව සහාය ලබාදීම හේතුවෙන් ඒකපාර්ශවීය පරීක්ෂණයක් පවත්වාලීමට සිදු නොවුනි.

මෙම ආරාවුලට හේතු වී ඇති පත්වීමේ උසස්වීම් ලබා නොදීම වෙනුවෙන් පාදක වූ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටි, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය, මැතිවරණ කොමසාරිස්වරයාගේ තීරණය හා තනතුරු පිරවීමට අධිකාරිය ගෙන ඇති පියවර වැනි වාර්තා සාක්ෂි ලෙස විනිශ්චයට භාජනය කරන ලදී.

මෙම තත්ත්වයන් විමසා බැලීමේදී, මෙම ඉල්ලුම්කරුවන් වන පළමු පාර්ශ්වය සිය සේවා ස්ථානයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවේදය අනුව, 2009.06.22 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ මුදල් කළමනාකරු තනතුරට පත්වීම ලබා දීම, එදින සිට බලපැවැත්වෙන පරිදි අහිමි වූ වැටුප් සහ සියලු දීමනා ලබා දීම මෙන්ම එම්. ටයිටස් පෙරේරා නමැති ඉල්ලුම්කරුට නිත්‍යානුකූලව හිමිව තිබූ වැඩ බැලීමේ පත්වීම සමග 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා එම තනතුරට අයත් වැඩබැලීමේ දීමනාව ලබා නොදීම නිසා සිදු වූ අගතිය නිසා එම තනතුරට අදාළ වැඩ බැලීමේ දීමනාව ලබා දීම යන කරුණු විමසා තීරණය ලබා දීමට නිර්දේශ කරමි. එසේම තීරු බදු රහිත වාහන හිමිකම පළමු ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකරු තනතුරට අයත් වරප්‍රසාදයක් වුවද, එම ප්‍රතිලාභය ලබා දීමට නියෝග නිකුත් කිරීම පිළිබඳව ද තීරණය කිරීමට සිදුව ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට සේවයට බඳවා ගැනීම, උසස්වීම්, මාරුවීම්වලට අදාළ සේවා කොන්දේසි ගිවිසුමක් මගින් ප්‍රදානය වේ. ඒ අනුව, එක් එක් තනතුරුවලට බඳවා ගෙන ගිවිසුම් කොන්දේසි අනුව සේවා පවත්වාගෙන යා යුතුව ඇත. මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය එම්. ටයිටස් පෙරේරා 1985.07.15 දින ද, ඩී. එම්. ජයවීර 1985.09.02 දින ද, ඊ. ඩී. කුමුදුනී මිය 1986.09.01 දින ද, ඩී. ජී. සුනිල් රත්නසිරි මයා 1987.01.26 දින ද, කාන්ති කළුආරච්චි 1992.02.10 දින ද සේවයට බැඳී ඇති අතර, ඔවුන්ගෙන් එම්. ටයිටස් පෙරේරා මයා 2001.04.02 දින හා අනෙකුත් ඉල්ලුම්කරුවන් 2003.05.17 දිනය ද වන සේ විධායක II ශ්‍රේණියේ සහකාර මූල්‍ය කළමනාකාර තනතුරට පත්වීම්, උසස්වීම ලැබී ඇත. ඉන්පසු, 2009.06.22 දිනැති ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර මුදල් තනතුරට උසස්වීම සඳහා සපුරා ඇති සුදුසුකම් අනුව ඉල්ලුම් කොට ඇත. එවකට මෙම තනතුරට බඳවා ගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් අභ්‍යන්තර නිලධාරීන්ට තිබූ සුදුසුකම් ප්‍රතිපාදනය අනුව, මෙම කණ්ඩායම සිය සේවා කාලය හා පළපුරුද්ද මෙන්ම, එවකට දැරූ තනතුර අනුව, මෙම තනතුරට ඉල්ලුම් කර තිබුනේ අර්ධ වෘත්තීය සුදුසුකම් ලත් හා වෘත්තීය සුදුසුකම් නොලත් කාණ්ඩය යටතේය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය විධායක I ශ්‍රේණියේ මූල්‍ය කළමනාකාර තනතුර පූර්ණ වෘත්තීය සුදුසුකම් ලත්, අර්ධ වෘත්තීය සුදුසුකම්ලත් හා වෘත්තීය සුදුසුකම් නොලත් යනුවෙන් වර්ගීකරණය කරන ලද සුදුස්සන් බඳවා ගෙන තිබීම, බඳවා ගැනීමේ පරිපාටිය අනුව පදනම් වී තිබිණි. එසේම 2009/2010 බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලැබී ඇත්තේ 2021 දී වන අතර, 2009/2010 වන විට බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලැබී නොතිබිණි. ඒ අනුව, මෙකී ඉල්ලුම්කරුවන් වෙත අභ්‍යන්තරික බඳවා ගැනීමේ ප්‍රතිපාදන යටතේ, මූලික සුදුසුකම් සපුරා තිබීම මත මෙකී සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වීමට හිමිකමක් තිබිය යුතු බව නිරීක්ෂණය කරමි. එසේ තිබියදී, 2019 බඳවා ගැනීමේ පරිපාටිය ඒ වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය භාරය, මූල්‍ය තත්ත්වය හා ගෝලීය ප්‍රවනතා අනුව, බඳවා ගන්නා තනතුරුවල තත්ත්වය කාලානුරූපව පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් ඉහළ නැංවීම අත්‍යාවශ්‍ය බව ද නිරීක්ෂණය කරමි.

ඉහත තනතුරට අදාළ උසස්වීම් ප්‍රදානය කළද, එම තනතුරට හිමි වරප්‍රසාදයක් ලෙස හිමි වාහන බලපත්‍රය ලබා දීම නිර්දේශ නොකරමි.

මෙම ඉල්ලුම්කරුවන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එම සේවා කාලය තුළ කිසිදු විනය විරෝධී දඬුවමකට හෝ රාජකාරි පැහැර හැරීමේ කාර්යයකට දඬුවම් නොලද, යහපත් කාර්ය සාධනයකට ලක් වූ සේවා පළපුරුදු නිලධාරීන් බවට නිරීක්ෂණය වන අතර, මොවුන් අධිකාරියේ සේවයට වැදගත් අත්දැකීම් බහුල කණ්ඩායමක් බව නිරීක්ෂණය විය.

තවද 2007 සිට 2009 දක්වා මෙකී තනතුර පුරප්පාඩුව තිබී එම්. ටයිටස් පෙරේරා මයා එහි වැඩබැලීමේ ජ්‍යෙෂ්ඨත්වයෙන් එයට සුදුසුකම් ලබා තිබුණ ද, අවස්ථාව අහිමි කිරීමත් නිරීක්ෂණය වන අතර, ඔහු වෙත එකී වැඩබැලීමේ පත්වීම ලබානොදීමෙන්, ඔහු වෙත අගතියක් සිදු වී ඇති බව නිරීක්ෂණය කරමි. එසේම එම තනතුර 2017 දක්වාම පුරප්පාඩු වී තිබීම මොහුට සිදු වූ අසාධාරණයක් බව නිරීක්ෂණය විය.

2009 වසරේ ඉල්ලුම්පත් කැඳවා ඒ සඳහා අභ්‍යන්තරික සුදුසුකම් සපුරා තිබියදීත්, සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීම පරිපාලනයේ දුර්වල තීරණයක් හා මොවුන්ට සිදු වූ අගතියක් බව නිරීක්ෂණය කරමි. මෙම පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති වාර්තා හා පෞද්ගලික සේවා තොරතුරු විමසීමේදී, අධිකාරියේ ක්‍රමික උසස්වීම් ලබමින් මෙසේ I ශ්‍රේණියේ මූල්‍ය කළමනාකාර තනතුරට අභ්‍යන්තරික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් පිරිසක් බව නිර්දේශ කරමි. එබැවින්, සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වීමට අවස්ථා නොලැබීමෙන් ඔවුන්ට අගතියක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

ඔවුන්ට ලබා දී ඇති මූලික පත්වීමේ සිට ක්‍රමික උසස්වීම් ලබමින්, ශ්‍රේණි උසස්වීම් ලද මෙම පිරිස් සේවා යෝජක අධිකාරිය වෙත පූර්ණ කාලීන සේවා දායකත්වය ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

එසේම මෙම උසස්වීම් ලබාදීම මැතිවරණ සමයක ඉටු කිරීමට සිදු වුවද එම උසස්වීම් ලබාදීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලබාදී තිබූ නියෝග ක්‍රියාත්මක නොකිරීමෙන් මොවුනට අසාධාරණ අගතියක් සිදුවී ඇති බව ද නිරීක්ෂණය කරමි.

එසේ වුවද, වර්තමානයේ මෙම අධිකාරියේ පුළුල් වන කාර්ය භාරය හා මූල්‍ය තත්ත්වය හා ගෝලීය ප්‍රවනතා අනුව, අභ්‍යන්තරික බඳවා ගැනීමේ සුදුසුකම් සමග කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කොට ඇති අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටි අනුව, මෙම තනතුර සඳහා වර්තමානයට ගැලපෙන මූල්‍ය කළමනාකරන හා මෙහෙයුම් පිළිබඳ වෘත්තිමය වරලත් සුදුසුකම් සහිත පුද්ගලයන් බඳවා ගැනීම අධිකාරි සේවයට එය අධිකාරියේ අනාගත සංවර්ධනයට හේතුවන බව ද අත්‍යාවශ්‍ය බව ද නිරීක්ෂණය කරමි.

තවද, මෙම සේවක පිරිස් අපේක්ෂිත උසස්වීම ක්‍රියාත්මක 2009.10.01 දින සිට විශ්‍රාම ගන්නා දිනය තෙක් අදාළ තනතුරෙහි නියමිත වැටුප් පරිමාණයේ පිහිටුවා හිඟ වැටුප් ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතු බව නිරීක්ෂණය කරමි.

එබැවින්, අධිකාරියේ එවකට ක්‍රියාත්මක බඳවා ගැනීම් පටිපාටි අනුව මෙම සේවක පිරිස මෙකී උසස්වීම නොලැබීමෙන් අසාධාරණයට ලක් වී ඇති බවත්, ඔවුන්ට අගතියක් සිදු වී ඇති බවත් තීරණය කරමින් මෙම ඉල්ලුම්කරුවන් කර ඇති ඉල්ලීම සාධාරණතාවය කිරීම යුක්ති යුක්ති කිරීම ඉල්ලුම්කාර පාර්ශ්වයට සිදු වී ඇති අගතියට සහනයක් ලබාදීම සුදුසු බවට මෙම පරීක්ෂණයේදී තීරණය කොට පහත සඳහන් ප්‍රදානයන් ක්‍රියාත්මක කිරීමට නිගමනය කරමි.

ප්‍රදානය

1. මේ අනුව, මෙම ඉල්ලුම්කාර කේ. කේ. කළුආරච්චි මහත්මිය ඇතුළු පස්දෙනා, 2009.10.01 දින සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ මුදල් කළමනාකාර තනතුරට උසස් කිරීම.

2. මෙම තනතුරට අදාළ උසස්වීම අදාළ ඉල්ලුම්කරුවන්ට පෞද්ගලික වන සේ ලබාදීම.

3. උසස්වීම ක්‍රියාත්මක දින සිට අදාළ වැටුප් පරිමාණයේ පිහිටුවා හිඟ වැටුප් ගෙවීම.
   ඒ අනුව, මෙම නිලධාරීන් පස්දෙනා සඳහා 2009.10.01 දින සිට ඔවුන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය දක්වා ගෙවිය යුතු හිඟ වැටුප රු. 4,712,996.00. (රුපියල් හතළිස් හත් ලක්ෂ දොළොස් දහස් නවසිය අනූ හය)
   (ඇමුණුම 01)

4. එසේ වුවද, මොවුන්ට මෙම තනතුර උසස් කිරීමට තීරණය කිරීම හේතුවෙන් අදාළ එකී තනතුරෙහි වරප්‍රසාද ලෙස හිමි ඉන්ධන, දුරකථන, අතිකාල දීමනා, වරප්‍රසාදිත වෙනත් දීමනා ආදිය වෙනුවෙන් ඔවුන් වෙත මසකට සාධාරණ ඒකාබද්ධ දීමනාවක් ලෙස රු. 1,000.000 බැගින් උසස්වීම ක්‍රියාත්මක දින පටන් වයස අවුරුදු 60 සම්පූර්ණ වන කාලයට අදාළ වසරකට රු. 12,000.00 බැගින් ලබාදීම.

   - ඒ අනුව, කේ. කේ. කළුආරච්චි මිය විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ මුදල් කළමනාකාර තනතුරට 2009.10.01 දින සිට පත්කොට, ඇයට ගෙවිය යුතු සම්පූර්ණ හිඟ වැටුප මුදලින් රු. 1,235,378.58 ක් ගෙවීම.

   - සුනිල් රත්නසිරි මයා විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ මුදල් කළමනාකාර තනතුරට 2009.10.01 දින සිට පත්කොට, ඔහුට ගෙවිය යුතු සම්පූර්ණ හිඟ වැටුප මුදලින් රු. 847,269.50 ක් ගෙවීම.

   - ඊ. ඩී. කුමුදනී මිය විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ මුදල් කළමනාකාර තනතුරට 2009.10.01 දින සිට පත් කරන ලදි. ඇයට ගෙවිය යුතු සම්පූර්ණ හිඟ වැටුප මුදලින් රු. 1,438,366.90 කි.

   - ඩී. එම්. ජයවීර මයා විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ මුදල් කළමනාකාර තනතුරට 2009.10.01 දින සිට පත්කොට, ඔහුට ගෙවිය යුතු සම්පූර්ණ හිඟ වැටුප මුදලින් රු. 1,046,524.30 ක් ගෙවීම.

   - එම්. ටයිටස් පෙරේරා මයා විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ මුදල් කළමනාකාර තනතුරෙහි 2007.10.01 දින සිට වැඩබැලීමට හා 2009.10.01 දින සිට ස්ථිරව පත්කොට ඔහුට ගෙවිය යුතු සම්පූර්ණ හිඟ වැටුප මුදලින් රු. 993,796.00 ක් ගෙවීම.

5. මෙම නිලධාරීන් උසස්වීම ලබන තනතුරට අදාළ තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබාදීමේ හිමිකමට, අදාළ තනතුරෙහි සක්‍රීය ලෙස සේවා දායකත්වය ලබා නොදීමේ හේතුව මත එකී සුදුසුකම ප්‍රදානය නොකිරීමට නිගමනය කරමි.

ඉහත සියළු ගෙවීම් මෙම ප්‍රදානය *ගැසට්* ගත කිරීමෙන් මසක් ඇතුළත සිදුකර සහකාර කම්කරු කොමසාරිස් දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත වාර්තා කරන ලෙස දෙවන පාර්ශ්වයට නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**සරත් චන්ද්‍රසිරි විතාන,**
බේරුම්කරු.

2024 මැයි මස 06 වන දින දී ය.

A/74/2022

ඇමුණුම 01

## ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කළ පහත නම් සඳහන් නිලධාරීන් සඳහා හිඟ වැටුප් ගෙවීම

| අනු අංකය | නම | කාල සීමාව | | එක් එක් නිලධාරියාට ගෙවිය යුතු හිඟ වැටුප (රු.) | අදාල ඒකාබද්ධ දීමනා එකතුව (රු.) | එක් එක් නිලධාරියාට ගෙවිය යුතු හිඟ වැටුපෙහි සහ දීමනාවල එකතුව (රු.) | එක් එක් නිලධාරියාගෙන් අය කරන සේ.අ.අ. 10% මුදල (රු.) | එක් එක් නිලධාරියාගෙන් අය කරන සේ.අ.අ. 10% අවකරණයෙන් පසු ගෙවිය යුතු මුදල (රු.) | සේ.අ.අ. 15% | සේ.නි.භා. 3% | මුළු එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | කේ. කේ. කළුආරච්චි මිය | 2009.10.01 | 2022.01.29 | 898,931.00 | 148,000.00 | 1,046,931.00 | 104,693.10 | 942,237.90 | 157,039.65 | 31,407.93 | 1,235,378.58 |
| 2 | සුනිල් රත්නසිරි මයා | 2009.10.01 | 2023.06.11 | 553,525.00 | 164,500.00 | 718,025.00 | 71,802.50 | 646,222.50 | 107,703.75 | 21,540.75 | 847,269.50 |
| 3 | ජ්. ඩී. කුමුදුනී මිය | 2009.10.01 | 2024.03.31 | 1,044,955.00 | 174,000.00 | 1,218,955.00 | 121,895.50 | 1,097,059.50 | 182,843.25 | 36,568.65 | 1,438,366.90 |
| 4 | ඩී. එම්. ජයවීර මයා | 2009.10.01 | 2022.12.31 | 727,885.00 | 159,000.00 | 886,885.00 | 88,688.50 | 798,196.50 | 133,032.75 | 26,606.55 | 1,046,524.30 |
| 5 | එම්. ටයිටස් පෙරේරා මයා | 2007.10.01 | 2009.09.30 | 369,200.00 | 104,000.00 | 842,200.00 | 84,220.00 | 757,980.00 | 126,330.00 | 25,266.00 | 993,796.00 |
| | | 2009.10.01 | 2018.06.03 | 369,000.00 | | | | | | | |
| | **එකතුව** | | | **3,963,496.00** | **749,500.00** | **4,712,996.00** | **471,299.60** | **4,241,696.40** | **706,949.40** | **141,389.88** | **5,561,335.28** |

EOG 06 – 0133